# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1841/18 – 2013 දෙසැම්බර් 20 වැනි සිකුරාදා – 2013.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, කයිට්ස් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අනලතිව්, උතුර, ජේ/37 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අනල තිව් ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක වයිඒ/කේවයිටී/2012/77 හා 2012.04.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් හෙක්. 0.0500 කින් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අරුල්මිහු ශ්‍රී සංගරනාදර් මහා කනපතිපිල්ලෙයාර් කෝවිල – ප්‍රමාණය: හෙක්. 0.0500 ක් පමණ**

උතුරට: ශන්මුගම් රාජරතිනම් හිමිකම් කියන පනෛයිවලාවු උද්‍යානය; නැගෙනහිරට: අරුල්මිහු ශ්‍රී සංගරනාදර් මහා කනපතිපිල්ලෙයාර් කෝවිල් ඉඩම උද්‍යානය අරුල් දේපල; දකුණට: නිවාසවල සිට ජැටියට මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: පොන්නම්බලම් මාකන්ඩු හිමිකම් කියන පනෛයි වලාවු උද්‍යානය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/9/2011/ඩබ්ලිව්එස්/214.
2013 මැයි මස 16 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 – 163

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලිස්පත්තුව බටහිර කෝරළේ සුළු කොට්ඨාසයේ මාබේරියතැන්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2011.10.25 දිනැතිව නිකුත් කර නැවත 2012.02.15 දිනැතිව සංශෝධනයකර සකස් කරනලද අංක මහ/එම්ඩීඩී/2011/267 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 2.1730 ක් පමණ වූ වික්ටෝරියාවත්ත නැමති පහත සඳහන් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වික්ටෝරියා වත්ත – ප්‍රමාණය: හෙක්. 2.1730**

උතුරට: රජවැල්ල හෝල්ඩින් පුද්ගලික සමාගම; නැගෙනහිරට: රජය හිමිකම් කියන මාබේරියතැන්න වත්ත (වික්ටෝරියා ජලාශ රක්ෂිතය); දකුණට: රජය හිමිකම් කියන මාබේරියතැන්න වත්ත; බටහිරට: මාර්ග (ප්‍රාදේශීය සභා).

ජනක බණ්ඩාර තෙන්නකෝන්.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2008/ඩී/262.
2013 මැයි මස 09 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 – 164


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*